දෙපාර්තමේන්තු නියෝග 03/ 2017

මගේ අංකය: පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.03.13

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
අතිරේක අධ්‍යක්ෂවරුන්/,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක/ ශාඛා ප්‍රධානීන්,

**<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පුහුණු පාඨමාලාව</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2015.09.01 දිනැතිව නිකුත් කරන ලද අංක 1930/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධියට පත් කර ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 8 වන ඡේදය හා බැඳේ.

02. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නියුතු එක් එක් ශ්‍රේණියෙහි නිලධාරීන් විසින් සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධ පැහැදිලි කිරීම් ඉහත කී ඡේදයෙහි සඳහන් වේ. ඒ අනුව, ශ්‍රී ලං.තා.සේ. III ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03)ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම ද, එකී සේවයේ II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03)ක් ගත වීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම ද, එකී සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05)ක් ගත වීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය. III වන කාර්යක්ෂමතා කඩඉම වනුයේ, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව කි.

03. මතු දැක්වෙන කරුණු සම්බන්ධයෙන් යථෝක්ත ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සඳහා සහභාගී වන නිලධාරීන්ගේ අවධානය යොමු කරවීම උදෙසා මෙම දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කරනු ලැබේ.

**01. පාඨමාලා ගාස්තු.**

- පුහුණු අපේක්ෂකයින් විසින් පාඨමාලා ගාස්තුව ගෙවීමේ පදනම මත පාඨමාලාවට ඇතුලත් කරගන්නා අතර, පාඨමාලාව නිසි පරිදි සම්පූර්ණ කළ බව තහවුරු කර ගැනීමෙන් පසු, එම මුදල දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.
- පාඨමාලාවට බඳවා ගැනීමේදී පුහුණු අපේක්ෂකයින් වෙත ලබා දුන් ගිවිසුම් පත්‍රය නිවැරදි ලෙස සම්පූර්ණ කර පිටපත් 02 න් යුතුව ඉදිරිපත් කළ යුතු ය.

- පාඨමාලාව අවසානයේ ප්‍රදානය කරනු ලබන සහතික පත්‍රයෙහි සහතික කරන ලද ඡායා පිටපතක් ආයතන ප්‍රධානියා මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

- යම් නිලධාරියෙකු විසින් අදාල පාඨමාලාව නිසි පරිදි සම්පූර්ණ නොකරන්නේ නම්, පාඨමාලා ගාස්තුව රජය මඟින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

**02. රාජකාරි නිවාඩු ලබා දීම.**

- පාඨමාලාවට සහභාගී වීමට ප්‍රථම, තම ආයතන ප්‍රධානියා ලවා රාජකාරි නිවාඩු අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතු ය.

- බස්නාහිර පළාතේ දිස්ත්‍රික්කයන්හි පිහිටි සේවා ස්ථාන වල සේවයේ නියුතු නිලධාරීන් හට පාඨමාලාව පැවැත්වෙන දින සඳහා පමණක් රාජකාරි නිවාඩු හිමි වේ.

- අනෙකුත් නිලධාරීන් සඳහා සේවා ස්ථානයේ සිට පාඨමාලාව පැවැත්වෙන ස්ථානයට ඇති දුර පදනම් කරගනිමින්, පාඨමාලාව පැවැත්වෙන දිනයට පෙර දිනයේ වරුවක රාජකාරි නිවාඩු අනුමත කළ හැකිය.

**03. දුම්රිය බලපත්‍ර හා ගමන් වියදම් ලබා දීම.**

- අවශ්‍ය වේ නම්, පාඨමාලාව සඳහා සහභාගී වන නිලධාරීන් හට, තම ඒකක ප්‍රධානී මඟින් රාජකාරි දුම්රිය බලපත්‍ර ලබා ගත හැකිය.

- පාඨමාලාව නියමිත කාලය තුළ දී සම්පූර්ණ කළ යුතු අතර, සහභාගීත්වය තහවුරු කිරීම සඳහා අදාල පුහුණු ආයතනයෙන් ලබා දෙන පැමිණීමේ සහතිකය ඒකක ප්‍රධානී වෙත ඉදිරිපත් කර, අදාල දීමනා ඒකක ප්‍රධානී වෙතින් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

04. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමට වග බලා ගන්නා ලෙසත් වැඩි දුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආචාර්ය, ආර්.ආර්.ඒ. විජේකෝන්.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීම පිණිස
02. විගණකාධිපති - එම